රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2016

මගේ අංකය : EST-6/LEAVE/03/3162
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2016.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයට නව ගිවිසුම් ආකෘතියක් ඇතුළත් කිරීම

2014.05.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2014 හා 2015.04.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛ විධිවිධාන අනුව කලත්‍රයා සමඟ විදේශගත වන රාජ්‍ය නිලධරයන් 33 වන පරිශිෂ්ටය ලෙස ආයතන සංග්‍රහයට ඇතුළත් කෙරෙන, මෙහි ඇමුණුම 01 ආකෘතිපත්‍රය පරිදි වූ ගිවිසුමකට අත්සන් කළ යුතු බවටත් ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16:5 උප වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු බවටත් 2016.05.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

16:5 නිවාඩු දෙනු ලබන්නේ අධ්‍යයනය සඳහා නම් 9 වැනි පරිශිෂ්ටයේ සඳහන් පරිද්දෙන් ද, රැකියාවක් සඳහා නම් 10 වැනි පරිශිෂ්ටයේ සඳහන් පරිද්දෙන් ද, නිලධරයා ගිවිසුමකට අත්සන් තැබිය යුතු ය. අධ්‍යයනය සහ රැකියාවක් කිරීමේ ඒකාබද්ධ පරමාර්ථය සඳහා නිවාඩු දෙනු ලබන විට භාවිතා කළ යුතු ආකෘති පත්‍රය 11 වැනි පරිශිෂ්ටයේ පරිදි විය යුතු අතර සිය කලත්‍රයා විදේශ ශිෂ්‍යත්ව සඳහා තෝරා ගනු ලබන අවස්ථාවක ඔහු සමඟ විදේශගත වන නිලධරයකු 33 වැනි පරිශිෂ්ටයේ සඳහන් ආකෘතිය පරිද්දෙන් ද ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

# 33 වැනි පරිශිෂ්ටය

(XII – 16:1:9)

## උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන රජයේ නිලධරයෙකු සමග වැටුප් රහිත නිවාඩු ලබා යන රජයේ සේවයේ නියුතු කලත්‍රයා අත්සන් කළ යුතු ගිවිසුමේ ආකෘතිය

(ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය නොමැතිව මෙම ආකෘතිය සංශෝධනය නොකළ යුතු ය.)

(මෙහි මින්මතු නිලධරයා යනුවෙන් සඳහන් කෙරෙන) (1)-------------- නමැත්තා එක් පක්ෂයකටද (මෙහි මින්මතු ආණ්ඩුව යනුවෙන් සඳහන් කෙරෙන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ක්‍රියාකරන ( මෙහි මින්මතු (2) --------------------- යනුවෙන් සඳහන් කෙරෙන) ශ්‍රී ලංකාවේ (3) ----------------------- තනතුර දරන (2)------- ---------------------- අනෙක් පක්ෂයටද බැදී ( (3) ----------------------- තනතුර දරන එකී (3) --------------------- ගෙන් පසු එම තනතුරට තත්කාලීනව පත්වන ඔහුගේ අනුප්‍රාප්තිකයෝද (3) ------------------- යන පාඨයට ඇතුලත් වන්නාහ.) එම දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් --------------ක් වූ -------------මස ------------ ----වැනිදා වන මෙදින ලියා අත්සන් කරනු ලබන ගිවිසුම පත්‍රයයි.

(5) ------------------- ට XII පරිච්ඡේදයේ 16:1:9 වගන්තියේ විධිවිධාන අනුව කලත්‍රයා සමඟ යාමට හැකිවනු පිණිස එකී නිලධරයා මුල් වතාවට මාස (4)------------------- කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු ඉල්ලා ඇති හෙයින් ද ,

එසේම එකී කාර්යය සඳහා එකී නිලධරයාට 20------------ වැනිදා පටන් මාස (4) -------------- වැටුප් රහිත නිවාඩු දීමට ආණ්ඩුව එකඟ වී ඇති හෙයින් ද,

දැන් මේ ලියා අත්සන් කරන ගිවිසුමේ වග හැටි නම් මෙසේය :-

(1) (5) ---------------------ට XII පරිච්ඡේදයේ 16:1:9 වගන්තියේ විධිවිධාන අනුව කලත්‍රයා සමග යාමට හැකිවනු පිණිස යථෝක්ත නිලධරයාට 20-------- වැනිදා පටන් මාස (4) ---------------වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමට ආණ්ඩුව එකඟ වෙයි.

(2) එකී නිලධරයා : -

(i) එකී (3) ---------------------- ගේ පූර්වානුමතිය නොලබා එකී වැටුප් රහිත නිවාඩුවෙන් ඉතිරව ඇති කිසිම කාලපරිච්ඡේදයක් වෙනත් කිසිම කාර්යයක් සඳහා යොදා ගැනීම නොකරන බවට ද,

(1) නිලධරයාගේ සම්පූර්ණ නම සහ පදවි නාමය

(2) ආයතන ප්‍රධානියාගේ සම්පූර්ණ නම

(3) ආයතන ප්‍රධානියාගේ පදවි නාමය

(4) වැටුප් රහිත නිවාඩු කාලය

(5) කලත්‍රයා සමග යන රට

**(7) අනිවාර්ය සේවා කාලය (මෙය ගණන් බැලිය යුත්තේ XII වැනි පරිච්ඡේදයේ 16:15 උපවගන්තියට අනුකූලවය.**

(ii) ඉහත කී වැටුප් රහිත නිවාඩු කාලය අවසන් වීමය. එසේ නැතහොත් කලත්‍රයාගේ අධ්‍යයන/ අභ්‍යාස පාඨමාලාව අවසන්වීමය යන දෙකින් කුමක් හෝ පළමුවෙන් සිදුවූ වහාම ශ්‍රී ලංකාවට ආපසු පැමිණ ආණ්ඩුව කරන තීරණය අවසාන තීරණය හැටියට පිළිගැනීමට බැඳෙමින් ආණ්ඩුව නියම කරන පරිදි කිසියම් පදවියක වැඩ බාරගෙන, වැඩ බාරගත් දින සිට මාස (7) --------------------- කට නොඅඩු කාලයක් ආණ්ඩුව යටතේ සේවය කිරීමට බැඳෙන බවට ද,

**(8) දණ්ඩන මුදල (මෙය ගණන් බැලිය යුත්තේ XV වැනි පරිච්ඡේදයේ 5:2 උපවගන්තියට අනුවය.)**

(iii) ඔහු හෝ ඇය තමාට අනුමත කරන ලද වැටුප් රහිත නිවාඩුව අවසන් වූ විට ශ්‍රී ලංකාවට ආපසු පැමිණීම පැහැර හැරියහොත් හෝ ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු ඉහත සඳහන් පරිදි ආණ්ඩුව යටතේ වැඩ බාර ගැනීමට අපොහොසත් වුවහොත් ඉහත සඳහන් පරිදි ආණ්ඩුව යටතේ වැඩ බාර ගැනීමෙන් පසු වැඩ බාර ගත් දින සිට යටත් පිරිසෙයින් මාස (7) ----------------------ක් වත් සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් පරිදි වැඩ බාර ගත් පසු එකී මාස (7) ---------------------- කාලය අවසන් වීමට පෙර ආණ්ඩුව යටතේ දරන පත්වීමෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එකී මාස (7) ------------------------- කාලය අවසන් වීමට පෙර අකාර්යක්ෂමතාවය නිසා හෝ වියදම් අඩු කිරීමේ හේතුව හැරුණු විට වෙනත් යම්කිසි හේතුවක් නිසා සේවයෙන් පහකරනු ලැබුව හොත්, නැතහොත් ධූරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ එසේත් නැතහොත් මෙම ගිවිසුමේ අනෙකුත් කොන්දේසි අතුරින් කිසිවක් පිළිපැදීමට අපොහොසත් වුවහොත් හෝ එවිට තමා ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් (8) -------------------ක් ආණ්ඩුවට ගෙවන බවට ද,

මෙයින් එකඟ වෙයි.

(3) තමාට දෙන ලද වැටුප් රහිත නිවාඩු කාලය දීර්ඝ කරන ලෙස එකී නිලධරයා ඉල්ලා සිටි විටකදී ආණ්ඩුවේ හුදු අභිමතය පරිදි එම වැටුප් රහිත නිවාඩු කාලය වරින්වර දීර්ඝ කිරීමට ආණ්ඩුවට පුළුවන් බවටද පාර්ශවකරුවන් අතරේ මෙයින් තවදුරටත් ගිවිසගනු ලැබේ. එතෙකුදු වුවත් වැටුප් රහිත නිවාඩු කාලය එසේ දීර්ඝ කරනු ලබන කල්හි නැවත වැඩ බාරගැනීමෙන් පසු සේවය කළ යුතු අවම අනිවාර්ය සේවා කාලය ආණ්ඩුව තීරණය කරන තවත් අමතර කාලයකින් ද, එසේම මෙම ගිවිසුමේ කොන්දේසි කඩකළහොත් යථෝක්ත නිලධරයා ගෙවිය යුතු මුදල ආණ්ඩුව තීරණය කරන තවත් අමතර මුදලකින්ද සමානුපාතිකව වැඩි කළ යුතු වන්නේය.*

* පහත සඳහන් සටහන බලන්න.

(4) වැටුප් රහිත නිවාඩු කාලය ඒ ආකාරයෙන් දීර්ඝ කිරීමෙන් ඉක්බිති නිලධරයා සේවය කිරීමට බැඳී සිටිය යුතු අවම අනිවාර්ය සේවා කාලයක්, සහ මේ ගිවිසුමේ කොන්දේසි කඩ කළහොත් නිලධරයා ගෙවිය යුතු වූ මුදල සමානුපාතිකව වැඩි කරනු ලබන අවස්ථාවක දී, මෙම ගිවිසුමේ දැනට සඳහන්ව ඇති වැටුප් රහිත නිවාඩු කාල සීමාව, අනිවාර්ය සේවා කාලය සහ නිලධරයා ගෙවිය යුතු වන මුදල යන මේවා වෙනුවට එකී වැටුප් රහිත නිවාඩු කාලසීමාවන්හි මුළු එකතුවද අනිවාර්ය සේවා කාල පරිච්ඡේදයන්හි මුළු එකතුවද නිලධරයා ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්හි මුළු එකතුවද මේ ගිවිසුමේ ඊට යෝග්‍ය වගන්ති වල පිළිවෙළින් ඇතුළත් කොට ඇත්තා සේ සලකා කියවීමටත් එසේ තේරුම් ගැනීමටත් මෙයින් ගිවිසගනු ලැබේ.*

(5) වැටුප් රහිත නිවාඩුව කලින් අවසන් වීම හේතුවෙන් නිලධරයා ශ්‍රී ලංකාවට පැමිණි විට ඉහත සඳහන් මාස (7) -------------------------- කාලයකට ඔහු සේවයේ නියුක්ත කරවා ගැනීමට ආණ්ඩුව බැඳී සිටින බවක් මෙහි සඳහන් කිසිවකිනුත් අදහස් කෙරෙතැයි නොසැලකිය යුතු ය.

(6) ඉහත 2,3 හා 4 වගන්ති වල සඳහන් කවර කරුණක් පිළිබඳව වුවද (3) ------------------- විසින් හෝ ඔහු වෙනුවට හෝ අත්සන් කරන ලද සහතිකයක්, එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වන බවට මෙයින් ගිවිස ගනු ලැබේ.

(7) (2)-------------------------------- යන පාඨයෙන් අදහස් කරන්නේ (2) -------------------------තනතුර දරන්නා වූ හෝ එම තනතුරේ වැඩ බලන්නා වූ හෝ (2) ----------------------විසින් දැනට කරනු ලබන කාර්යයන් එවකට ඉටු කරන්නා වූ හෝ නිලධරයායි.

මීට සාක්ෂි වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් ----------------------ක් වූ ------------------ මස -------------------- වැනිදා වන මෙදින ------------------- දී අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් එකී (2) -------------------------- පහත සඳහන් අය ඉදිරිපිටදී අත්සන් කරන ලද බවට,

අත්සන : ------------------------------
පදවි නාමය : --------------------------------

**සාකෂිකරුවෝ :-**

1. අත්සන :------------------------
   නම :-------------------------
   ලිපිනය :------------------------

2. අත්සන :------------------------
   නම :-------------------------
   ලිපිනය :------------------------

එකී (1) ---------------------------------- විසින් පහත සඳහන් අය ඉදිරිපිටදී අත්සන් කරන ලද බවට -

අත්සන : --------------------------

**සාකෂිකරුවෝ :-**

1 අත්සන :------------------------
  නම :-------------------------
  ලිපිනය :------------------------

2 අත්සන :------------------------
  නම :-------------------------
  ලිපිනය :------------------------

***සටහන -**

(1) නිලධරයෙකුගේ වැටුප් රහිත නිවාඩු කාලය, ගිවිසුම් පත්‍රයෙහි මුලදී සඳහන් කරන ලද කාලය ඉක්මවා දීර්ඝ කරනු ලබන විට ඊට සමානුපාතිකව අනිවාර්ය සේවා කාලය ද දණ්ඩන මුදල ද වැඩි කළ යුතු ය.

(2) වැඩි කරන ලද අනිවාර්ය සේවා කාලය හා වැඩි කරන ලද දණ්ඩන මුදල නිවාඩු දීර්ඝ කරනු ලබන අවස්ථාවේම නිලධරයාට දන්වා ඊට ඔහුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබාගෙන එය ගිවිසුමත් සමග ගොනු කර තැබිය යුතු ය.